# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## ඇබෑර්තු

## අධ්‍යයන, අධ්‍යයන සහායක, පරිපාලන, ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි සහ සුළු ශ්‍රේණි කාර්ය මණ්ඩලය

**අයදුම් කරනු ලබන විෂය ක්ෂේත්‍රය/ ක්ෂේත්‍ර පහත සඳහන් දෙපාර්තමේන්තු වලට අදාළ විය යුතු අතර විෂය ක්ෂේත්‍ර, විශේෂ සටහන් හා ඉදිරිපත් කළ යුතු ලේඛන සඳහා ඉංග්‍රීසි පුවත්පත් දැන්වීම හෝ විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වෙත යොමු වන්න.**

### අධ්‍යයන කාර්ය මණ්ඩලය

01. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය (ස්ථිර නොකල) තනතුර, කථිකාචාර්ය (පරිවාස) තනතුර

#### වෛද්‍ය පීඨය
- සායනික විද්‍යා අධ්‍යනාංශය

#### ඉංජිනේරු පීඨය
- ගගන ඉංජිනේරු අධ්‍යනාංශය
- යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යනාංශය
- විදුලි, විද්‍යුත් හා සන්නිවේදන ඉංජිනේරු අධ්‍යනාංශය
- නාවුක ඉංජිනේරු අධ්‍යනාංශය

#### කළමණාකරණ, සමාජවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය
- කළමනාකරණ හා මූල්‍ය අධ්‍යනාංශය
- භාෂා අධ්‍යනාංශය

#### සම සෞඛ්‍ය විද්‍යා පීඨය
- හෙද විද්‍යාව හා සූතිකාකර්ම අධ්‍යනාංශය

#### තාක්ෂණ පීඨය
- ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යනාංශය
- ඉංජිනේරු තාක්ෂණ අධ්‍යනාංශය

#### පරිගණක පීඨය
- පරිගණක විද්‍යා අධ්‍යනාංශය
- පරිගණක ඉංජිනේරු අධ්‍යනාංශය

#### අපරාධ යුක්ති පීඨය
- අපරාධ විද්‍යා අධ්‍යනාංශය

**දක්ෂිණ මණ්ඩපය - සූරියවැව**

#### නිර්මිත පරිසර සහ අවකාශීය විද්‍යා පීඨය
- වාස්තු විද්‍යා අධ්‍යනාංශය
- අවකාශ විද්‍යා අධ්‍යනාංශය

#### කාර්මික අධ්‍යයන පීඨය
- කාර්මික තත්ත්ව කළමනාකරණ අධ්‍යනාංශය
- දේපල හා ආයෝජන කළමනාකරණ අධ්‍යනාංශය

### අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය

02. උපදේශක තනතුර - II ශ්‍රේණිය

#### ඉංජිනේරු පීඨය
- ගගන ඉංජිනේරු අධ්‍යනාංශය
- යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යනාංශය

#### පරිගණක පීඨය
- පරිගණක විද්‍යා අධ්‍යනාංශය

### පරිපාලන කාර්ය මණ්ඩලය

03. සහකාර ලේඛකාධිකාරී තනතුර
04. සහකාර ලේඛකාධිකාරී තනතුර - නීති හා ලේඛන

### ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය

05. තාක්ෂණික නිලධාරී තනතුර II ශ්‍රේණිය 'ආ' බණ්ඩය
06. තාක්ෂණික නිලධාරී (යාන්ත්‍රික) තනතුර III ශ්‍රේණිය
07. තාක්ෂණික නිලධාරී (විදුලි) තනතුර III ශ්‍රේණිය
08. තාක්ෂණික නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික) තනතුර III ශ්‍රේණිය

### සුළු ශ්‍රේණි කාර්ය මණ්ඩලය

09. අරක්කැමි තනතුර III ශ්‍රේණිය

## වැටුප් පරිමාණ

### අධ්‍යයන, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය

01. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය තනතුර :-**
U-AC 3 (I) Rs. 160,520 - 7x3,900 – 187,820 p.m. + (116% + 2,200 අධ්‍යයන දීමනාව, වෙනත් අනුමත දීමනා)

02. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුර :-**
U-AC 3 (II) Rs. 138,980 - 11 x 2,940 – 171,320 p.m. + (116% + 2,100 අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

03. **කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර :-**
U-AC 3 (III) Rs. 121,340 - 5 x 2,940 – 136,040 p.m. + (102% + 1,800 අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

04. **කථිකාචාර්ය (පරිවාස) තනතුර**
U-AC 3 (IV) Rs. 94,400 – 10 x 2,400 – 118,400 p.m. + (91% + 1,200 අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

05. **උපදේශක II ශ්‍රේණිය තනතුර**
U-AS 1(I) Rs. 81,285 – 19 x 1,240 – 104,845 p.m. + (වෙනත් අනුමත දීමනා)

### පරිපාලන කාර්ය මණ්ඩලය

06. **සහකාර ලේඛකාධිකාරී තනතුර/ සහකාර ලේඛකාධිකාරී තනතුර - නීති හා ලේඛන :-**
U-EX 1 (II) Rs. 85,305 - 3x2,020 – 91,365 (EB) 93,765; 12x2,400 – 122,565 p.m. + (වෙනත් අනුමත දීමනා)

### ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය

07. **තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය 'ආ' බණ්ඩය තනතුර / තාක්ෂණික නිලධාරී (යාන්ත්‍රික) III ශ්‍රේණිය තනතුර / තාක්ෂණික නිලධාරී (විදුලි) III ශ්‍රේණිය තනතුර / තාක්ෂණික නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික) III ශ්‍රේණිය තනතුර**
U-MT I (III) Rs. 51,095 – 07x540; 10x640 – 61,275 p.m + (වෙනත් අනුමත දීමනා)

### සුළු ශ්‍රේණි කාර්ය මණ්ඩලය

08. **අරක්කැමි III ශ්‍රේණිය තනතුර**
U-PL 2 (III) Rs. 44,575 – 16x490 – 52,415 p.m + (වෙනත් අනුමත දීමනා)

### වෙනත් ප්‍රතිලාභ

සුදුසුකම් ලත් තනතුරු සඳහා සප්තවාර්ෂික නිවාඩු, ඉහත සඳහන් අධ්‍යයන දීමනා සහ පර්යේෂණ දීමනාව, සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා දායකත්වය, පාරිතෝෂික දීමනාව සඳහා හිමිකම, සේවකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාලයීය රෝහලේ ප්‍රමුඛ ප්‍රතිකාර සහ වෙනත් වරප්‍රසාද.

### බඳවා ගැනීමේ ක්‍රමවේදය

තනතුරට අදාළ වන පරිදි අභියෝග්‍යතා පරීක්ෂණයක / ප්‍රායෝගික පරීක්ෂණයක හෝ ඉදිරිපත් කිරීමේ ඇගයීමක ප්‍රතිඵල මත පදනම්ව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගැනීම සිදු කෙරේ.

### පොදු කොන්දේසි

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් තෝරා ගැනීම ඒ ඒ තනතුරෙහි අනුමත ඇබෑර්තු ගණන සම්පූර්ණ වනතෙක් පමණක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් සිදුකරනු ඇත.
3. අයදුම්කරුවන් විසින් වෙබ් අඩවියෙන් **(www.kdu.ac.lk)** භාගත කරගෙන තමා විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතික වල සහතික කළ ඡායා පිටපත් සහිතව **2026 ජුනි මස 30** වෙනි දින හෝ එදිනට පෙර ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් එවීම හෝ ගෙනවිත් භාර දීම කළ යුතුය.
4. ලියුම් කවරයේ ඉහළ වම්පස කෙලවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
5. අයදුම්කරුවන් එක් තනතුරකට වඩා අයදුම් කරන විට එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.
6. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානියා හරහා තම අයදුම්පත් යොමු කළ යුතුය.
7. අපේක්ෂකයින් අයදුම් කිරීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවා අවසන් වන දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.
8. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් **(www.kdu.ac.lk)** භාගත කරගත හැකි ආකෘතිය මගින් පමණක් අදාල තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට තරයේ දන්වා සිටිනු ලැබේ. ප්‍රමාදවී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිභාහිරව එවනු ලබන අයදුම්පත් සහ ඉහත අංක 06 හි ලබාදී ඇති උපදෙස් අනුගමනය කර නොමැති හා අංක 07 ට අනුගත නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
9. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත.
10. අධ්‍යයන සහ අධ්‍යයන සහායක තනතුරු සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන් සිය ඉගැන්වීමේ හැකියාව ඔප්පුකර පෙන්වනු පිණිස තේරීම් කමිටුව ඉදිරියේ ඉදිරිපත් කිරීමක් (ඉංග්‍රීසි භාෂාවෙන්) කල යුතුය.
11. තෝරාගන්නා ලද අපේක්ෂකයින්ට මෙම විශ්වවිද්‍යාලයේ ඕනෑම පරිශ්‍රයක සේවය කිරීමට හා රාජකාරී කිරීමට හැකියාව තිබිය යුතුය.
12. අයදුම්කරුවන් තෝරාගැනීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව සහ ඇගයීමේ හා සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදුකරනු ඇත.
13. අයදුම්කරුවන් ඇගයීමේ ක්‍රියාවලිය සඳහා යොමු කිරීමට හා සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලයට ඇත.
14. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ආසන්නතම වැටුප් චක්‍රලේඛයන් අනුව වැටුප ගෙවනු ලබන අතර වැටුපට අමතරව රජය විසින් අනුමත කරන ලද වෙනත් දීමනා ගෙවනු ලැබේ.
15. මෙම තනතුරු ස්ථිර අතර පත්වීම වසර තුනක (03) පරිවාස කාලයක් සඳහා යටත් වේ.
16. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි තනතුරු අංක 01 හා 02 හි සුදුසුකම් අංක (ii) හෝ (iii) යටතේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පත්වීම් සඳහා සලකා බලනුයේ අංක (i) යටතේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති නම් හෝ පත්කිරීමට අසතුටුදායක යැයි තේරීම් කමිටුව තීරණය කරන්නේ නම් පමණකි.
17. තෝරාගන්නා ලද රජයේ දෙපාර්තමේන්තුහි සේවයේ නියුතු අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හරහා තම සේවයෙන් මුදා හැරීම ලබා ගත යුතු අතර විශ්වවිද්‍යාලයීය සේවා කාලය සඳහා විශ්‍රාම වැටුපට හිමිකම් නොලබයි.
18. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයන් සහ සුදුසුකම් සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ, සහ ඒවායේ විශේෂ සටහන් හා අදාළ සංශෝධන වෙත යොමු වෙන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

| | |
|---|---|
| ◆ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය (පරිවාස) තනතුර | - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක 721, 935, 08/2016, 08/2016 (i), 08/2016 (ii), 08/2016 (iii) |
| ◆ කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර | - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක 07/2018 |
| ◆ උපදේශක II ශ්‍රේණිය තනතුර | - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක 725 හා විශ්වවිද්‍යාලයීය බඳවා ගැනීමේ පටිපාටිය |
| ◆ සහකාර ලේඛකාධිකාරී තනතුර | - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක 15/2017 |
| ◆ සහකාර ලේඛකාධිකාරී තනතුර - නීති හා ලේඛන | - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක 948 |
| ◆ තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය 'ආ' බණ්ඩය තනතුර | - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක 622, 763 |
| ◆ තාක්ෂණික නිලධාරී (යාන්ත්‍රික) III ශ්‍රේණිය තනතුර / තාක්ෂණික නිලධාරී (විදුලි) III ශ්‍රේණිය තනතුර / තාක්ෂණික නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික) III ශ්‍රේණිය තනතුර | - වි.ප්‍ර.කො. චක්‍රලේඛ අංක 05/2022 |
| ◆ අරක්කැමි III ශ්‍රේණිය තනතුර | - විශ්වවිද්‍යාලයීය බඳවා ගැනීමේ පටිපාටිය |

**අයදුම්පත් එවිය යුතු ලිපිනය**
**ලේඛකාධිකාරී,**
**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල**
**ආරක්ෂක විශ්වවිද්‍යාලය,**
**රත්මලාන 10390, ශ්‍රී ලංකාව**

**අවසාන දිනය**
**2026.06.30**

**වැඩි විස්තර සඳහා පිවිසෙන්න**
**www.kdu.ac.lk**